# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2074/37 - 2018 ජුනි මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2018.06.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කරගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය:* -MCUDP/LA / ABT(W-05) /14/03.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය :* 4-3/ 10 /2016/LRB/172.

කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සිදුකරනු ලබන උප ව්‍යාපෘතියක් වන මාදිවෙල නැගෙනහිර හැරවුම් ව්‍යාපෘතිය නිසා වැසි කාලයේදී තලංගම වැව, ඇවරිහේන වැව සහ අවට ප්‍රදේශවල එකතු වන වැසි ජලය කැලණි ගඟට යොමු කිරීම සඳහා ඇළ ඉවුරු සවිමත්ව සංරක්ෂණය කිරීමට අවශ්‍ය ඉඩම් අත්කරගැනීම සඳහා පහත විස්තර කර ඇති ඉඩම් කොටස් රජයට අත්කර ගැනීමට ඇති බව 1964 අංක 28 දරන ඉඩම් අත්කරගැනීමේ (සංශෝධිත) පනතේ 7 වැනි වගන්තයේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

*ඉඩමේ විස්තර:*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 502- උඩුමුල්ල උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයට අයත් උඩුමුල්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2018.05.10 දිනැතිව පිළියෙළ කර ඇති අංක කො 9763 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 සහ 2 වශයෙන් දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0663 ක් වූ පහත දක්වා ඇති ඉඩම් කැබලි.

01. කැබලි අංක 1

ඉඩමේ නම: ඇලමුල්ලවත්ත;වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන අය: බාලසූරිය අප්පුහාමිලාගේ පද්මිණී පෙරේරා, අංක. 5, අඹතලේ, අංගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0316.

02. කැබලි අංක 2

ඉඩමේ නම: ඇලමුල්ලවත්ත සහ බෝගහවත්ත;වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන අය: පත්තිනියගේ දොන් කරුණාරත්න, අංක 52, අඹතලේ, මුල්ලේරියාව; ප්‍රමාණය: හෙක්. 0.0347.


1A - G 27826 - 27 (2018/06)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ඉහත සඳහන් ඉඩමට අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය පැවරූ අයවලුන් 2018 ජූලි මස 05 වැනි දින පෙ.ව. 9.30 ට රාජගිරිය, වැලිකඩ, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 03 දරන ස්ථානයේ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ පිහිටා ඇති කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ ඉඩම් අත්කරගැනීමේ කාර්යාලයේ දී මා හමුවිය යුතු ය.

තව ද, 2018 ජූනි මස 29 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම අත්කරගැනීම සඳහා වන්දි මුදල් ඉල්ලා සිටීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් ඒ සඳහා ඉල්ලා සිටින වන්දි මුදල හා එය ගණනය කළ ආකාරයත් පිටපත් දෙකක් සහිත ලියවිල්ලක් මා වෙත ඉදිරිපත් කළ යුතු ය.

සී. ඩබ්. අබේසූරිය,
ඉඩම් අත්කරගැනීමේ නිලධාරි,
කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය.

2018 ජූනි මස 06 වැනි දින,
කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය,
ඉඩම් අත්කරගැනීමේ නිලධාරි කාර්යාලය,
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.

06 - 866

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.